ජූනි 05 වන දින Dan News වෙත සාකච්ඡාවක් ලබාදෙන මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජික මහාචාර්ය රත්නජීවන් හූල් විසින් කළා යැයි පැවසෙන ඇතැම් ප්‍රතිචාරයන් සම්බන්ධයෙන් ජනමාධ්‍ය තුළ සඳහන් කිරීම් දක්නට ලැබිණි.

මෙහිදී හූල් විසින් "සිංහලෙන් පළ වන කුණු කතන්දර කියවන්නේ නැත" කියා ප්‍රකාශ කළේ යැයි දක්වමින් 'හූල් ඕල් වෙයිද' යන මැයෙන් ජූනි 08 දිනමිණ පුවත්පතේ පළවූ කතුවැකියකි. එසේම හූල් විසින් "සිංහල භාෂාවෙන් ලියන කුණු කියවන්නට තමන් නොදන්නේය" කියා ප්‍රකාශ කළ බව දක්වමින් ජූනි 08 මව්බිම පුවත්පතේ පළ වූ ලිපියකි. මෙම ලිපි දෙකේම කොටස් තුළ හූල් වෙත දෝෂාරෝපණයන් එල්ල කොට තිබුණේ ඔහු විසින් සිංහල භාෂාව කුණු ලියන භාෂාවක් ලෙසින් හඳුන්වමින් සිංහල භාෂාවට අපහාස කළේ යැයි දක්වමිනි. එසේම හූල් පැවසූවා කියා දක්වන මෙම ප්‍රකාශයේ ජාතිවාදී ස්වභාවයක් ගැබ්ව තිබේය යනුවෙන්ද දිනමිණ කතුවැකියේ සඳහන් වේ.

හූල් විසින් Dan News වෙත ලබාදුන් සාකච්ඡාව තුළ මෙම කරුණ මතුවූ සම්පූර්ණ සන්දර්භය සලකා බලමු. එහි ඔහු පවසන කරුණු වල සිංහල පරිවර්තනය මෙසේයි: "...ඔවුන් මට තර්ජනය කිරීමෙන්/බිය වැද්දීමෙන් වංචා කරන්නට උත්සාහ කරනවා. මම සිංහල දන්නේ නෑ. ඔවුන් සිංහලෙන් ලියන කුණු මට කියවන්න බැහැ...". මෙම සාකච්ඡාවේ 1.04 සිට වන කරුණු විමසූ විට පෙනී යන්නේ, හූල් විසින් පවසන්නේ "සිංහල බසින් ලියැවෙන දෑ කුණු" බවක් නොව "සිංහල බසින් ලියැවෙන කුණු" කියවන්නේ නැති බවයි. මව්බිම හා දිනමිණ ලිපි තුළ උපුටනයන්ද එය සනාථ කරයි. වෙනත් ලෙසකින් දක්වන්නේ නම්, මෙහි හූල් විසින් සිංහල භාෂාව සමස්තයක් ලෙසින් ගෙන නොදක්වන අතර සිංහලෙන් පළවන ඇතැම් අන්තර්ගතයන් සම්බන්ධයෙන් පමණක් කථා කරයි.

එසේ බැලූ විට හූල් විසින් සිංහල භාෂාවට අපහාස කර ඇතැයි, සිංහල භාෂාව කුණු ලියන භාෂාවක් ලෙස සඳහන් කර ඇතැයි දිනමිණ හා මව්බිම පුවත්පත් පවසන්නේ කුමන පදනමක පිහිටමින්ද? මෙය යමෙකු පැවසූ කරුණු විකෘති කර දැක්වීමක්, වැරදි අර්ථකතන ලබාදීමක් සහ ඒ ඔස්සේ පාඨකයාව නොමග යැවීමක් නොවේද? එසේ ගත් විට මෙය බරපතල ජනමාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයක් නොවේද?
Dan News සාකච්ඡාවට ප්‍රවේශය මෙතැනින්: https://youtu.be/w4TzsNElOz4

**#MediaEthicsSL #lka #SinhalaPress #News #Dinamina #Mawbima**